# නීති සැදීම




**දිල්රුක්ෂි සමරවීර**

නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක

# පාර්ලිමේන්තුව මඟින් නීති පැනවීම.

* පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව මුළු ශ්‍රී ලංකාවටම බලපාන පරිදි නීති සාදනු ලබයි.

* "නීතිය" යන්නට ඇතුළත් වන්නේ මොනවාද?

  * ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ "නීතිය" යන යෙදුමට දී ඇති අර්ථ නිරූපණය වැදගත් වේ.

නීතිය →

- පාර්ලිමේන්තුව විසින් පනවන යම් පනතක්
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පනවන ලද පනතක් හෝ ආඥාපනතක්
- රාජ්‍ය සභා ආඥාවක්

* පාර්ලිමේන්තුව විසින් නීති පැනවීමේ දී විශේෂයෙන් වැදගත් වන විධිවිධාන මොනවාද?

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාවේ සිට 84 වන ව්‍යවස්ථාව දක්වා විධිවිධාන

- 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන.

- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග.

* ඉහත විධිවිධාන සැලකීමේ දී පාර්ලිමේන්තුවට පහත දැක්වෙන ආකාරයේ නීති සම්මත කරගත හැකි ය.

1. මුළු ශ්‍රී ලංකාවටම බලපාන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ සංවෘත ලැයිස්තුවේ (II වන ලැයිස්තුව) හා සමගාමී ලැයිස්තුවේ (III වන ලැයිස්තුව) ඇති විෂයයන්ට අදාළ නීති.

2. ඉහත විෂයයන්ට අදාළ අතීතයට බලපාන නීති.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නා වූ හෝ පරිච්ඡින්න කරන්නා වූ නීති.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(3) වන ව්‍යවස්ථාව අනුව අදාළ පළාත් සභාවල එකඟත්වය ලබා ගැනීමෙන් පසුව නැතහොත් ජාත්‍යන්තර මට්ටමෙන් එකඟ වූ ගිවිසුමක්, සම්මුතියක් හෝ එකඟවීමක් ක්‍රියාත්මක කිරීම සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ (I වන ලැයිස්තුව) විෂයයන්ට අදාළ වන නීති.

* පාර්ලිමේන්තුවේ දී සම්මත කරන සෑම නීතියකම පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් සාදනු ලැබේ.

* නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් පනත් කෙටුම්පත් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම සකස් කරනු ලබයි.

* පාර්ලිමේන්තුව විසින් පහත දැක්වෙන වර්ගවල පනත් සම්මත කරනු ලබයි :-

1. නව නීති සම්පාදනය සඳහා වන පනත්.
2. පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා වන පනත්.
3. පෞද්ගලික මන්ත්‍රී පනත්.

## නව නීති සම්පාදනය කිරීම සඳහා සහ පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත්.

* මෙම පනත් කෙටුම්පත් වර්ග දෙකම සකස් කිරීමේ දී, එකම කාර්ය පටිපාටියක් අනුගමනය කරනු ලබයි.

* පළමුවෙන්ම මධ්‍යම රජයේ විෂයය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කිරීමට අදහස් කරන නීතියේ අරමුණ හා ඊට අදාළ වන හේතු දක්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් යෝජිත ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

* යෝජිත ප්‍රතිපත්තියට අනුමැතිය ලබා දීමේ දී අමාත්‍ය මණ්ඩලය විසින් පහත කරුණු සලකා බලයි :-

- යෝජිත නීතිය අවශ්‍යය ද යන්න.
- ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් යෝජිත ප්‍රතිපත්තියට සංශෝධන අවශ්‍ය ද යන්න.
- යෝජිත ප්‍රතිපත්තියට අදාළ මූල්‍යමය වියදම කොපමණ ද යන්න.

* අමාත්‍ය මණ්ඩලය විසින්, යෝජිත ප්‍රතිපත්තියට යම් වෙනස් කිරීමක් අවශ්‍ය වන්නේ නම් එය ද දක්වමින්, යෝජිත ප්‍රතිපත්තිය අනුමත කරනු ලැබේ.

* යම් අමාත්‍ය මණ්ඩල සංදේශයක් එසේ අනුමත කරනු ලැබූ විට අදාළ අමාත්‍යාංශය විසින් අදාළ නීති කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකරනු ලැබේ.

# නීති කෙටුම්පත් සම්පාදන ක්‍රියාවලිය

## ප්‍රාරම්භක පනත් කෙටුම්පත සකස් කිරීම

* යම් පනතක් කෙටුම්පත් කිරීම සඳහා වන ඉල්ලීමක් අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය සහ එය අනුමත කරන්නා වූ අමාත්‍ය මණ්ඩල තීරණය සමඟ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ලැබුණු විට, නීති කෙටුම්පත් සම්පාදකවරයා විසින් නව ලිපිගොනුවක් විවෘත කර දෙපාර්තමේන්තුවේ නීති නිලධරයකු වෙත එම ලේඛන යොමු කරනු ලබන අතර, එතැන් සිට නීති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වේ.

* පනත කෙටුම්පත් කිරීමේ දී අදාළ අමාත්‍යාංශයේ නිලධරයන්ගෙන් අවශ්‍ය උපදෙස් හා පැහැදිලි කිරීම් ලබා ගැනීමට නීති කෙටුම්පත් සම්පාදකගේ උපදෙස් මත දෙපාර්තමේන්තුවේ නීති නිලධරයන් ක්‍රියා කරති.

* පළමුවෙන් ම සකස් කෙරෙන පනත් කෙටුම්පත ප්‍රාරම්භක කෙටුම්පත (Preliminary Draft) ලෙස හැඳින්වෙන අතර ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර අදාළ අමාත්‍යාංශය වෙත නිරීක්ෂණ සඳහා යවනු ලැබේ.

* එයට නිරීක්ෂණ ඇතොත් සංශෝධිත කෙටුම්පතක් සකස් කර නැවත අදාළ අමාත්‍යාංශයට යවනු ලැබේ.

* පනත් කෙටුම්පතට අදාළ අමාත්‍යාංශයේ ද, අදාළ වෙනත් ආයතනවල ද එකඟත්වය ලැබෙන  තෙක් වරින් වර සංශෝධනය කරමින් වාර ගණනාවක දී සංශෝධිත කෙටුම්පත් සකස් කර යැවීමට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට සිදු වේ.

* මේ අනුව පනත් කෙටුම්පතක් සකස් කර අවසන් කිරීමට ගතවන කාලය කොපමණ ද යන්න නිශ්චිතව සඳහන් කිරීමට නොහැකි වන අතර, වරින් වර යෝජනා කරනු ලබන සංශෝධන නිසා අවසන් කෙටුම්පත සකස් කිරීමට දීර්ඝ කාලයක් ගතවන අවස්ථා ද ඇත.

## අවසාන පනත් කෙටුම්පත සකස් කිරීම.

* මේ ආකාරයට සංශෝධිත පනත් කෙටුම්පත් එකක් හෝ කිහිපයක් අදාළ අමාත්‍යාංශයට යවනු ලබන අතර, කෙටුම්පත සඳහා අමාත්‍යාංශයේ එකඟත්වය ලැබුණු පසුව, අවසාන පනත් කෙටුම්පත නීතිපතිවරයාට ද පිටපතක් සහිතව අදාළ අමාත්‍යාංශය වෙත යවනු ලැබේ.

* පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ කාර්යභාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 වන ව්‍යවස්ථාවේ දක්වා ඇත.

* ඒ අනුව, පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව සහතිකයක් නීතිපතිවරයා විසින් නිකුත් කරනු ලබන අතර, එහිදී පනත් කෙටුම්පතේ යම් ව්‍යවස්ථානුකූල නොවන විධිවිධාන තිබේ නම් එම විධිවිධාන ව්‍යවස්ථානුකූල බවට පත් කිරීම සඳහා අවශ්‍ය වන යම් සංශෝධන තිබේ නම් ස්වකීය සහතිකය එම සංශෝධන සිදු කිරීමට යටත්ව ද, නීතිපතිවරයා විසින් නිකුත් කළ හැකි ය.

* නීතිපතිවරයා විසින් යෝජනා කරන ලද සංශෝධන වෙතොත්, එම සංශෝධන අදාළ අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් පනත් කෙටුම්පතට ඇතුළත් කළ පසු පනත් කෙටුම්පත අදාළ අමාත්‍යාංශය වෙත යවනු ලැබේ.

* අදාළ අමාත්‍යාංශය විසින් පනත් කෙටුම්පත නීතිපතිවරයාගේ සහතිකයද සමඟ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා යොමු කරනු ලැබේ.

## සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම,

* පනත් කෙටුම්පතට නීතිපතිවරයාගේ සහතිකය ලැබුණු පසුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ පරිවර්තන අංශ මගින් පනත් කෙටුම්පත සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරනු ලැබේ,

* අවසාන කෙටුම්පත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් අදාළ අමාත්‍යාංශය වෙත යවනු ලැබේ.

## ගැසට් පත්‍රයේ පළ කිරීම.

* පනත් කෙටුම්පත හා ඊට සිදු කර ඇති සංශෝධන ද, නීතිපතිවරයාගේ සහතිකය ද සලකා බැලීමෙන් පසුව, අමාත්‍ය මණ්ඩලය විසින් අදාළ පනත් කෙටුම්පත අනුමත කර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් එය ගැසට් පත්‍රයේ පළ කරන ලෙස රජයේ මුද්‍රණාලයාධිපතිට උපදෙස් දෙනු ලැබේ.

* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාව අනුව සෑම පනත් කෙටුම්පතක් ම, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට අවම වශයෙන් දින දාහතරකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

# පනත් කෙටුම්පත පළමුවර කියවීම.

* පනත් කෙටුම්පතක් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් සති දෙකක් ඉක්ම ගිය පසු එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, එය පනත් කෙටුම්පත පළමුවර කියවීම ලෙස හැඳින්වේ.

* මුද්‍රණය කරන ලද පනත් කෙටුම්පතට පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් අංකයක් ලබා දෙයි.

* පවත්නා පනතක් සංශෝධනය කරන්නා වූ පනත් කෙටුම්පතකට නීතිය බලපෑමේ ප්‍රකාශයක් ද ඇතුළත් වන අතර, එමගින් අදාළ සංශෝධනයෙන් නීතියට සිදුවන බලපෑම ලුහුඬින් දක්වනු ලැබේ.

## දෙවන වර කියවීම

* පළමුවර කියවීමෙන් සතියක් ඉක්ම ගිය පසු යම් දිනයක පනත් කෙටුම්පත විවාදයට භාජනය කරනු ලබන අතර, මෙය දෙවන වර කියවීම ලෙස හැඳින්වේ.

* පනත් කෙටුම්පත මුද්‍රණය කිරීමෙන් පසුව පනතට තවදුරටත් හරයාත්මක සංශෝධන සිදු කරනු නොලබන අතර, ආනුෂංගික සංශෝධන සිදු කිරීම අවශ්‍ය වන්නේ නම් දෙවන වර කියවීමෙන් පසුව එළඹෙන කාරක සභා අවස්ථාවේ දී සිදු කරන සංශෝධන වශයෙන් එම සංශෝධන ඇතුළත් කරනු ලැබේ.

* අමාත්‍ය මණ්ඩලය විසින් මුල් අවස්ථාවේ අනුමත කරනු නොලැබූ කිසිදු කරුණක් කාරක සභා අවස්ථාවේ සංශෝධන ලෙස ඇතුළත් කළ නොහැකි **ය**.

* කාරක සභා අවස්ථාවේ දී පාර්ලිමේන්තුව විසින් සියලුම මන්ත්‍රීවරුන් කාරක සභාවක් ලෙස රැස්වන අතර, පනත් කෙටුම්පතේ වගන්ති එකින් එක සලකා බලා , කාරක සභා අවස්ථාවේ දී සිදු කළ යුතු සංශෝධන වෙතොත් ඒ සංශෝධන ද ඇතුළත් කර ඡන්ද විමසීමකින් සම්මත කරගනු ලැබේ.

* කාරක සභාව විසින් පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසුව එය තුන්වන වර කියවනු ලැබේ.

## කථානායකවරයාගේ සහතිකය

* පාර්ලිමේන්තුව විසින් සම්මත කරගනු ලබන පනත් කෙටුම්පතක් නීතියක් බවට පත් වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව අනුව ඊට කථානායකවරයා විසින් ස්වකීය අත්සන සමඟ සහතිකය ලබා දිය යුතු ය.

* අනතුරුව පනත් කෙටුම්පත නීතියක් බවට පත්වන අතර, ඊට අනුක්‍රමික අංකයක් ලබා දෙයි.

# පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත්

* පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

* පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණු විට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අතර, දෙවන වර කියවීමට පෙර ප්‍රතිශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ.

* මෙම පනත් කෙටුම්පත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් 15 දෙනෙකුගෙන් සමන්විත ස්ථාවර කාරක සභාවක් මගින් වගන්තියෙන් වගන්තිය සලකා බලා, සංශෝධන අවශ්‍ය වන්නේ නම් ඒවා ද ඇතුළත් කොට සම්මත කරනු ලැබේ.

* මෙම පනත් ද සම්මත කරනු ලැබූ පසු නීතිය බවට පත්වන්නේ කථානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව අනුව ස්වකීය අත්සන සහිතව සහතිකය ලබාදුන් පසුව ය.

## පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බලතල

*** පනත් කෙටුම්පත් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරන අවස්ථා දෙකකි -**

පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් අනතුරුව සතියක කාල සීමාව තුළ දී -

1. ජනතාව විසින් එම පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලිඛිතව යොමු කිරීමෙන් ; සහ

2. ජනාධිපතිවරයා විසින් අදාළ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි ද යන්න ශ්‍රේෂ්ඨාධිකරණයේ දී සලකා බැලීම සඳහා අග්‍ර විනිශ්චයකාරවරයා වෙත ලිඛිතව යොමු කිරීමෙන්,

* ඉහත අවස්ථාවල දී, පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ 2/3ක බලයට අමතරව ජනමත විචාරණයක් අවශ්‍ය වන්නේ ද යන්න ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලබයි

* ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනමත විචාරණයක් අවශ්‍ය බවට තීරණය වූ පනත් කෙටුම්පතක්, ජනමත විචාරණයක දී ජනතාව විසින් අනුමත කරනු ලැබුවහොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන සහිතව සහතිකයක් පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් සටහන් කරනු ලැබූ විට එය නීතියක් බවට පත් වේ.

~ ස්තූතියි ~